කකුල් හෝ ගාත් (සංග්රහයක්) වෙත ඇරයුම් කරනු ලබන්නෙම් නම්, මම පිළිතුරු දෙමි.

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “කකුලක් හෝ ගාතක් (පිළියෙල කර සංග්රහයක්) වෙත ඇරයුම් කරනු ලබන්නෙම් නම්,
මම පිළිතුරු දෙමි. එමෙන්ම කකුලක් හෝ ගාතක් මා වෙත පිරිනමනු ලැබුවද මම පිළිගනිමි. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාගේ සදාචාරයත්, එතුමාගේ යටහත් පහත් භාවයත්, ජනයාගේ සිත් ඇඳගන්නා සුළු අයුරින් කටයුතු කර තිබීමත්, පිරිනමන ලද පරිත්යාගයක් එය ස්වල්පයක් වුවද එතුමා පිළිගන්නකු බවත් පෙන්වා දෙයි. නිවසක සංග්රහයක් වෙත ඇරයුම් කරනු ලබන විට එය ස්වල්පයක් වුවද එයට පිළිතුරු දිය යුතුය. පරිත්යාග පිළිගැනීමත් ඇරයුමට පිළිතුරු දීමත් ඇරයුම් කරන්නාට ලෙන්ගතු වීමකි. එකිනෙකා අතර ආදරය ඇති කිරීමට හේතුවෙකි. ප්රතික්ෂේප කිරීමත් එයට එකඟ නොවීමත් සතුරුකම හා වෙන්වීම ඇති කරයි. එය සුඵ වුව ද අවතක්සේරු නොකළ යුතුය. කකුල් හා ගාත් යන්න විශේෂයෙන් සඳහන් කර ඇත්තේ පහත් දෑ හා වැදගත් දෑ අතර එක්කිරීමක් වශයෙනි. සැබැවින්ම ගාත් අනෙකුත් කොටස්වලට වඩා සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාට වඩාත් ප්රියමනාප විය. එමෙන්ම කකුල් එයට කිසිදු වටිනාකමක් නැත.

https://sunnah.global/hadeeth/si/show/6216